ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | **14.03.2013** |

## ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය ජපාන මූල්‍ය බුද්ධි ඒකකය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹේ



*(ජපාන මූල්‍ය බුද්ධි ඒකකයේ ජාත්‍යන්තර සහයෝගිතා අංශ ප්‍රධානී නඔකි කොජිමා මහතා (වම් පස) සහ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකක අධ්‍යක්ෂ ඩී.එම්.රූපසිංහ මහතා (දකුණු පස) අවබෝධතා ගිවිසුම් හුවමාරු කරගත් අවස්ථාව)*

මුදල් විශුද්ධිකරනය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම පිළිබඳ විමර්ශන සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු හුවමාරු කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය) ජපාන මූල්‍ය බුද්ධි මධ්‍යස්ථානය (Japan Financial Intelligence Center - JAFIC) / (ජපාන මූල්‍ය බුද්ධි ඒකකය) සමඟ 2013 මාර්තු මස 11 දින ශ්‍රී ලංකා මහ බැංකුවේදී අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබුණි.

මුදල් විශුද්ධිකරනය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම බොහෝවිට ජාත්‍යන්තර සබඳතා සහිතව සිදුකරන ක්‍රියාකාරකම් වේ. එම නිසා මෙවැනි අපරාධ වලට එරෙහිව සටන් කිරීමේදී ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය බුද්ධි ඒකක අතර ඉහළ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. ඒ අනුව තොරතුරු හුවමාරු කරගැනීම මගින් එකිනෙකා අතර සහයෝගීතාව ඇති කර ගැනීම සඳහා ලොව පුරා විසිරී ඇති මූල්‍ය බුද්ධි ඒකක අවබෝධතා ගිවිසුම් උපයෝගීකර ගනී. ජපාන මූල්‍ය බුද්ධි ඒකකය සමඟ ඇතිකරගත් මෙම ගිවිසුම මූල්‍ය බුද්ධි ඒකක දෙක අතර තොරතුරු හුවමාරු කරගැනීමේදී ඉහළ සහයෝගීතාවක් හා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීමට ඉවහල් වනු ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මේ වන විට ඕස්ට්‍රේලියාව, ඇෆ්ගනිස්තානය, බෙල්ජියම, බංග්ලාදේශය, කැනඩාව, කාම්බෝජියාව, ෆීජී, ඉන්දියාව, ඉන්දුනීසියාව, මලයාසියාව, මොංගෝලියාව, නේපාලය, පිලිපීනය, සොලමන් දූපත්, දකුණු කොරියාව, රුසියානු සමූහාණ්ඩුව, සොල්වේනියාව, දකුණු අප්‍රිකාව, සෞදි අරාබියාව සහ ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු මූල්‍ය බුද්ධි ඒකක 20ක් සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹ ඇත. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීම සිදු කෙරුණි.